



# ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත් අයදුම් කරන අයදුම්කරුවන්ගෙන් ජෛවමිතික දත්ත ලබා ගැනීම

01. 2015 අංක 07 දරණ පනතින් සංශෝධිත 1948 අංක 20 දරණ ශ්‍රී ලංකා ආගාමික හා විගාමික පනතෙන් විධිවිධාන සලසා ඇති පරිදි ශ්‍රී ලංකාවේදී විදේශ ගමන් බලපත් අයදුම් කරන අයදුම්කරුවන්ගෙන් ජෛවමිතික දත්ත (ඇඟිලිසලකුණු හා මුහුණෙහි අංකිත ඡායාරූපයක්) අනිවාර්යයෙන් ලබා ගැනීමේ ක්‍රමවේදය 2018 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලදී.

02. 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත සඳහන් ක්‍රමවේදය ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත්‍රයක් අයදුම් කරන අයදුම්කරුවන් සඳහා ද ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව 2018 ජනවාරි මස 01 දින හෝ ඊට පසුව ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල හරහා ශ්‍රී ලාංකීක ගමන් බලපත්‍රයක් අයදුම්කර ස්වකීය ගමන් බලපත්‍රය ලබා ගැනීමෙන් පසු ශ්‍රී ලංකාවට පැමිණෙන පළමු අවස්ථාවේදී ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත පැමිණ සිය ජෛවමිතික දත්ත (ඇඟිලි සලකුණු) ලබා දීම අනිවාර්ය වේ. ශ්‍රී ලංකාවෙන් නැවත පිටත්ව යාමට අවසර දෙනු ලබන්නේ මෙම අවශ්‍යතාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පමණි. මෙය අදාළ වන්නේ වයස අවුරුදු 16-60 දක්වා වයස් සීමාව තුළ ගමන් බලපත් ලබා ගත් අයදුම්කරුවන් සඳහා පමණි.

03. ගුවන් තොටුපළ හරහා ශ්‍රී ලංකාවට ඇතුළුවීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

(අ) විදේශ දූත මණ්ඩලයක් හරහා අයදුම් කොට ගමන් බලපත්‍රයක් ලබාගත් පුද්ගලයන් ශ්‍රී ලංකාවට පැමිණෙන පළමු අවස්ථාවේදී ආගමන විගමන කවුළුව (Immigration counter) වෙත නොගොස් සෘජුවම ප්‍රධාන ආගමන නිලධරයා වෙත වාර්තා කිරීම කළ හැකිය. එසේත් නැතිනම් ආගමන විගමන කවුළුව වෙත ගොස් ආගමන විගමන නිලධරයාගේ උපදෙස් අනුව ප්‍රධාන ආගමන නිලධරයා වෙත ඔවුන්ව යොමු කෙරෙනු ඇත. අනතුරුව ප්‍රධාන ආගමන නිලධරයා විසින් සුවිශේෂි යොමු අංකයකින් යුත් ස්වයංක්‍රීයව නිකුත් කරනු ලබන (System generated) ජෛවමිතික දත්ත ලබා ගැනීමේ ආකෘති පත්‍රිකාවක් පිටපත් දෙකකින් යුතුව නිකුත් කරනු ලැබේ. මින් එක් ආකෘති පත්‍රයක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ජෛවමිතික දත්ත ලබා ගන්නා අවස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා එම පුද්ගලයා වෙත ලබාදෙනු ලැබේ.

(ආ) ගුවන් තොටුපළෙහි ජෛවමිතික දත්ත ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් නොමැති බැවින් මේ සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත පැමිණිය යුතුය.

04. ශ්‍රී ලංකාවට ඇතුළු වීමෙන් අනතුරුව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

(අ) ජෛවමිතික දත්ත ලබාදීම සඳහා බත්තරමුල්ලේ පිහිටි ප්‍රධාන කාර්යාලය වෙත හෝ එහි ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයකට වාර්තා කළ හැකිය. මෙම කාර්යය සඳහා විශේෂ කවුළුවක් විදේශ දූත මණ්ඩල අංශයෙහි ස්ථාපිත කරනු ලබන අතර, ඇඟිලි සලකුණු ලබාදීම වෙනුවෙන් කිසිදු ගාස්තුවක් අය කරනු නොලැබේ.

(ආ)ජෛවමිතික දත්ත ලබාදීමේදී සිදුවන අනවශ්‍ය ප්‍රමාදවීම් වළක්වා ගැනීමට දෙපාර්තමේන්තු වෙබ් අඩවිය ඔස්සේ දිනය සහ වේලාව වෙන්කර ගැනීමට අන්තර්ජාල මාර්ගගත වෙන්කිරීමේ ක්‍රමවේදය මගින් පහසුකම් සලසා ඇත.

(ඇ) ජෛවමිතික දත්ත ලබා දීමෙන් අනතුරුව ජෛවමිතික තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදය සම්පූර්ණ කිරීම සනාථ කිරීමට අදාළව ස්වයංක්‍රීයව නිකුත් කරන ලද සහතිකපතක් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අතර, විධිමත්ව ජෛවමිතික තොරතුරු ලබාදුන් පුද්ගලයන්ට ඕනෑම අවස්ථාවක රටින් පිටත් වීමට හැකිවන පරිදි ප්‍රත්‍යන්ත පාලන පද්ධතිය යාවත්කාලීන කරනු ලැබේ. ජෛවමිතික දත්ත ලබා ගැනීමේ ක්‍රමවේදය නිම කිරීම සඳහා නිශ්චය කරන ලද කාලය සාමාන්‍යයෙන් විනාඩි 45 කි.

(ඈ) මෙම ජෛවමිතික දත්ත ලබා ගැනීමේ ක්‍රමවේදය හේතුවෙන් දැනට භාවිතා කරන ගමන්බලපතෙහි ඇතුළත් තොරතුරු වල කිසිදු වෙනසක් සිදු නොවේ.

05. මෙම ක්‍රමවේදය පිළිබඳව වැඩිදුර පැහැදිලි කර ගැනීමට විදේශ දූත මණ්ඩල අංශයේ නියෝජ්‍ය/සහකාරපාලක වෙතින් උපදෙස් ලබා ගත හැකිය.

දුරකථන අංකය
_94 11 5329230,_94 77 3499085
ෆැක්ස්
_94 11 2879213

විද්‍යුත් තැපෑල
acom@immigration'gov'lk

08. මෙම ක්‍රමවේදය සාර්ථක කර ගැනීම සඳහා ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**එම්.එන්. රණසිංහ**
පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

## විනී හෙට්ටිගොඩ



**FAKE FRIENDS**
are like
**SHADOWS.**
They follow you
in the **sun**
but leave you
in the
**DARK**